රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 18/94

මගේ අංකය :- III/0266/2/68(පොදු)එල්/එච්එෆ්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994.05.13 වැනි දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් .

## ආයතන සංග්‍රහයට සංශෝධන - **XXIV** පරිච්ජේදය
## නීති අනු මණ්ඩල.

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ජේදයේ 11:4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

11:4 දේපලෙහි අයිතිය පිළිබඳ වාර්තාවක් 11:4:2 හෝ 11:4:3 හි සඳහන් පුද්ගලයන්ගෙන් එක් අයෙකුගෙන් ලබා ගත හැක.

11:4:1 නොවෙනස්ව පවතිනු ඇත.

11:4:2 දේපල පිහිටා ඇති ප්‍රදේශයේ රජයේ නීතිඥවරයා

11:4:3 ප්‍රසිද්ධ නොතිරිස්වරයෙක් ලෙස අවුරුදු 10 ක පළපුරුද්දක් ඇති, ඉඩම පිහිටා ඇති උසාවි බලප්‍රදේශයේ කටයුතු කරන ඕනෑම නීතිඥ වරයෙකු.

අයිතිය පිළිබඳ වාර්තාව 11:4:3 හි සඳහන් නීතිඥවරයෙගෙන් ලබා ගන්නේ නම්, එම වාර්තාව සමග පහත 11:4:4 හි සඳහන් පරිදි සහතිකයක් ද එම නීතිඥවරයා විසින් සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතුය.

11:4:4 "........................................................... (ඉඩමේ නම) ට අදාළ හිමිකම් වාර්තාව නිසි අවධානය යොදමින් මා විසින් පිළියෙල කළ අතර, මා ප්‍රසිද්ධ නොතාරිස් වරයෙක් ලෙස අවුරුදු 10 වඩා පළපුරුද්දක් ඇති අයෙකු බවද, මෙම ඉඩම පිහිටා ඇති උසාවි බලප්‍රදේශයේ කටයුතු කරන නීතිඥවරයෙන් බව ද මෙයින් සහතික කරමි"

...........................................
(අත්සන)

නම: ...........................................

නම : ...................................
නිලමුද්‍රාව

02. අයිතිය පිළිබඳ වාර්තාවක් සඳහා නීතිඥවරයෙකුට ගෙවිය යුතු ගාස්තු පරිමාණයන් පිළිබඳව ඇති විධිවිධාන මෙයින් අවලංගු කෙරේ.

03. මේ අනුව ආයතන සංග්‍රහයේ 26 වන පරිශිෂ්ඨය අවලංගු කරනු ලැබේ.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙණිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.